Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ශ්‍රේණිය : 6

විෂය : ගණිතය

සතිය :06


**පාඩම :- කාලය ( 1 වන සතිය)**
**කාලච්ඡේද ගණන :- 06**

- ඔරලෝසු මුහුණතක සවිකර ඇති කටු තුන පිළිබඳව නිවැරදිව විස්තර කරන්න.
- පෙළපොතේ 38 හා 39 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.
- පැය කටුව, මිනිත්තුකටුව, තත්පර කටුව අතර සම්බන්ධතා නිවැරදිව ලියන්න.

| **පැය 1 = මිනිත්තු 60** | **මිනිත්තු 1 = තත්පර 60** |
|---|---|


ඔරලෝසු මුහුණතක දක්වා ඇති වේලාව පැය, මිනිත්තු, තත්පර අනුව නිවැරදිව ලියන්න.


උදා:-





වේලාව 01.25.20

පහත දැක්වෙන ඔරලෝසු මුහුණත්වල දැක්වෙන වේලාව පැය, මිනිත්තු, තත්පර ඇසුරින් ලියන්න.







පෙළපොතේ 39 පිටුවේ 4.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 40 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.
- මධ්‍යහ්න 12, මධ්‍යම රාත්‍රී 12, පෙරවරුව, පස්වරුව, දිනය නිවැරදිව විස්තර කරන්න.


| |
|---|
| **දින 1 = වරු 2 = පැය 24** |

පහත දැක්වෙන ඔරලෝසු මුහුණත්වල දැක්වෙන වේලාව පෙරවරු, පස්වරු අනුව ලියන්න. ( ඉර,හඳ අනුව පෙරවරු, පස්වරු හඳුනාගන්න.)


උදා:-






පස්වරු 1.30




පෙරවරු 2.55








පෙළපොතේ 42 පිටුව බලන්න. පැය 12 ක්‍රමයට ලියා ඇති වේලාව සම්මත ක්‍රමයට ලිවීමේදී වේලාව දැක්වීම නිවැරදිව අධ්‍යයනය කරන්න.

යා කරන්න.

| **පැය 12 ක්‍රමයට අනුව වේලාව** | **සම්මත ක්‍රමයට අනුව වේලාව** |
|---|---|
| පෙ.ව. 2.00 | 09:45 |
| පෙ.ව. 4.30 | 16:30 |
| පෙ.ව. 9.45 | 02:00 |
| පෙ.ව. 11.30 | 12:00 |
| ප.ව. 4.30 | 24:00 |
| ප.ව. 7.45 | 04:30 |
| මධ්‍යාහ්න 12.00 | 11:30 |
| මධ්‍යම රාත්‍රී 12.00 | 19:45 |

- පෙළපොතේ 43 පිටුවේ 4.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 44 පිටුව අධ්‍යයනය කරන්න.
- සම්මත ආකාරයට දිනය දැක්වීමේ වර්ෂය, මාසය, දිනය යොදන ආකාරය විස්තර කරන්න.

**2020 දෙසැම්බර් 31 වන දින අන්තර්ජාතික සම්මත ආකාරයට දක්වනුයේ 2020- 12-31 ලෙස වේ.**

පහත දැක්වෙන දිනයන් සම්මත ක්‍රමයට ලියන්න.

1) 1987 ජනවාරි මස 17 වන දින
2) 2010 මාර්තු මස 08 වන දින
3) 2015 ජූලි මස 01 වන දින
4) 2021 ජනවාරි මස 11 වන දින